සුවෙන් පෙරට

eඉගෙනුම් පියස

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

වාරය - II

| ශ්‍රේණිය - 6 | විෂයය- සිංහල භාෂාව හා සාහිත්‍යය | පාඩම- 8- නලපාන ජාතකය |
|---|---|---|

- **පාඩම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

01. පන්සිය පනස් ජාතක පොත ලියවුණේ කිනම් රාජධානී සමයක ද?

02. ජාතක පොතේ ඇතුළත් කතා සංඛ්‍යාව කොපමණ ද?

03. නලපාන ජාතකය උපුටා ගෙන ඇත්තේ කුමන ග්‍රන්ථයෙන් ද?

04. ජාතක කතාවලට අනුව බෝසත්තුමා උපත ලද සත්ත්ව කුල දෙකක් සඳහන් කරන්න.

05. බුදුන්වහන්සේ නලපාන ජාතකය දේශනා කිරීමට හේතු වූ කාරණාව කුමක් ද?

06. වනයේ විසූ වඳුරු රජ සෙසු වඳුරන්ට දුන් අවවාදය උපුටා දක්වන්න.

07. පොකුණේ සතුන් අල්ලා කන දිය රකුසෙකු ඇතැයි වඳුරු නායකයා වටහා ගන්නේ කෙසේ ද?

08. වඳුරු නායකයාගේ චරිතය තුළ තිබූ නායකයකු සතු විශිෂ්ට ගුණාංග මොනවා ද?

09. "කුමක් නිසා උනු ද ? පොකුණට බැස පැන් බොව"

    (1) මෙසේ ප්‍රකාශ කරන්නේ කවරෙකු ද?

    (2) ඉහත ප්‍රකාශය කිරීමට හේතුව කුමක් ද?

10. ඔබ දන්නා වෙනත් ජාතක කතා දෙකක් ලියන්න.

11. අරුත් පැහැදිලි කරන්න.

(1) ඇඹුල් - ............................................................
(2) උදක - ............................................................
(3) ඒකාන්තයෙන් - ............................................................
(4) ධවල - ............................................................
(5) පුෂ්පකරණීහු - ............................................................
(6) කල්පස්ථායික - ............................................................
(7) පරිගෘහිත - ............................................................
(8) වඳුරු මුළ - ............................................................
(9) ඵලාඵලයෙක් - ............................................................
(10) බටුවන් - ............................................................

## මහාප්‍රාණ අක්ෂර

- සිංහල වර්ණ මාලාවේ ව්‍යඤ්ජන අක්ෂරවලට අයත් මහාප්‍රාණ අක්ෂර 10ක් හා අල්පප්‍රාණ අක්ෂර 10ක් ඇත.
- උච්චාරණය කිරීමේ දී අඩු හඬකින් ශබ්දවන අකුරු අල්පප්‍රාණ අක්ෂර ලෙස හඳුන්වයි.
- ක, ග, ච, ජ, ට, ඩ, ත, ද, ප, බ අල්පප්‍රාණ අක්ෂර වේ.
- උච්චාරණයේ දී ශ්වසන වායුව වැඩි ප්‍රමාණයක් පිට කරමින් ශබ්ද කරන අකුරු මහාප්‍රාණ අක්ෂර ලෙස හඳුන්වයි.
- ඛ, ඝ, ඡ, ඣ, ඨ, ඪ, ථ, ධ, ඵ, භ මහාප්‍රාණ අක්ෂර වේ.

01 . මහාප්‍රාණ අක්ෂර හා අල්පප්‍රාණ අක්ෂර සහිත වචන ලියන්න.

| අල්පප්‍රාණ අක්ෂර සහිත වචන | මහාප්‍රාණ අක්ෂර සහිත වචන |
|---|---|
| ක - ම<u>කු</u>නය | ඛ - සං<u>ඛ</u> |
| ග - | ඝ - |
| ච - | ඡ - |
| ජ - | ඣ - |
| ට - | ඨ - |
| ඩ - | ඪ - |
| ත - | ථ - |
| ද - | ධ - |
| ප - | ඵ - |
| බ - | හ - |

02. පහත සඳහන් වචන සුදුසු අක්ෂර යොදා සම්පූර්ණ කරන්න.

(1) බෝ......සත්වයෝ ( ධි / දි )

(2) වි ....... න ( ධා / ද )

(3) මු ..... (ක / ඛ )

(4) ...... යංකර ( හ / බ )

(5) ...... ටීකාර (ග / ඝ )

# සඤ්ඤක අක්ෂර

- සිංහල වර්ණ මාලාවේ ව්‍යඤ්ජන අක්ෂරවලට අයත් සඤ්ඤක අක්ෂර 5ක් ඇත.
- ඟ, ජ, ඬ, ඳ, ඹ සඤ්ඤක අක්ෂර වේ.

1. පහත සඳහන් වචනවලට සුදුසු සඤ්ඤක අක්ෂර වරහන තුළින් තෝරා සම්පූර්ණ කරන්න.

(1) අ ..... ල
(2) අ ..... නවා
(3) සුව .....
(4) ඇ .....
(5) ග .....
(6) අ .....
(7) ඉ ..... කටුව
(8) ව ..... රු
(9) ඇ .....ල්
(10) ද .....

(ඳ, ඹු, ඟ, ඹ, ඬ, ඳු, ඳ, ඟ, ඳි, ඬු )

2. හිස්තැනට සුදුසු පදය තෝරා ලියන්න.

(1) ...................... උඩින් කොක්කු ගියා. (ගඟට / ගගට)

(2) මම දෙමාපියන් .................. පාසල් යමි. (වැද / වැඳ )

(3) කොළ .................. පානය ඉතා ගුණවත්ය. (කැද / කැඳ )

(4) ..................... ළමයින් බිල්ලෝ අල්ලති. (අඬන / අඩන )

(5) අපි ................. අච්චාරු කෑවෙමු. ( අඹ / අබ )

# න, ණ, ල, ළ භාවිතය

න, ණ, ල, ළ අක්ෂර උච්චාරණයේ දී සමාන හඬින් ශබ්ද වේ. ඒවා ලිවීමේ දී අදාළ අකුරු වචනයක නියමිත ස්ථානයේ නො යෙදුණහොත් අර්ථය වෙනස් වේ.

1. පහත දැක්වෙන වචනවලට සුදුසු පරිදි න, ණ, ල, ළ අකුරු යොදා ලියන්න.

   (1) වලාකු.....

   (2) .....දරුවා

   (3) ප්‍රදර්ශ.....ය

   (4) මො.....රා

   (5) ජනගහ..... ය

   (6) පැ.....තවාන

   (7) .....හිරු

   (8) තරු.....යා

   (9) බ.....ලා

   (10) .....ය මුදල

2. හිස්තැනට සුදුසු පදය තෝරා ලියන්න.

   (1) වඳුරු රංචුව .....................දෙසට ගමන් කරති. ( වනය / වණය )

   (2) මල්ලී ........... ගාමින් මව දෙසට යයි. ( දණ / දන )

   (3) අපි කුඩා .............. සිට ම හොඳ දරුවෝ වෙමු. ( කල / කළ )

   (4) අසරණයන්ට .................. වීම උතුම් ගුණාංගයකි. (සරණ / සරන )

   (5) ගොවියා වල් .................. ගැලවීය. (පැළ / පැල )